**ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය**
**මධ්‍ය වාර පරීක්ෂණය - 2014**
**පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජාපාලනය I**

**11 ශ්‍රේණිය** **කාලය :- පැය 01**

නම / විභාග අංකය : ..........................................................................................

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**අංක 1 - 10 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. ශ්‍රී ලංකාවේ පරිසරය සංරක්ෂණය හා සම්බන්ධ පහත සඳහන් ආයතන අතරට අදාල නොවන්නේ කුමක්ද ?
    1. මධ්‍යම පරිසර අධිකාරිය 2. කෘෂි රක්ෂණ මණ්ඩලය
    3. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව 4. පළාත් පාලන ආයතනය (...................)

02. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් සභාව හා මධ්‍යම ආණ්ඩුව අතර නියෝජිතයා ලෙස ක්‍රියා කරන්නේ,
    1. මහ ඇමති ය 2. ආණ්ඩුකාරවරයා ය
    3. ඔම්බුඩ්ස්මන් ය 4. අගමැති ය (...................)

03. "ප්‍රජාතන්ත්‍රවාදය දේශපාලන දර්ශනයකි." ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මෙම නිර්වචනය ඉදිරිපත් කළේ.
    1. ඒබ්‍රහම් ලින්කන්ය 2. සීලර් ය
    3. ජේ.ආර්. ලවෙල්ය 4. ඊ.බී. ටයිලර් ය (...................)

04. රාජ්‍යයේ ප්‍රධාන අංග වනුයේ,
    1. භූමිය, ආණ්ඩුව, බලය හා පොදු දේපලයයි
    2. භූමිය, ජනගහණය, ආණ්ඩුව හා ස්වාධිපත්‍ය බලයයි
    3. ආණ්ඩුව, ජනගහණය, නීතිය හා පොදු දේපලයයි
    4. ජනගහණය, භූමිය, ආණ්ඩු හා අධිකරණයයි (...................)

05. දේශපාලන විද්‍යාඥයන් ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය ආකාර දෙකකට විග්‍රහ කරන්නේ,
    1. පාලන ක්‍රමයක් හා දේශපාලන දර්ශනයක් ලෙසය
    2. පාලන ක්‍රමයක් හා ජීවන ක්‍රමයක් ලෙසය
    3. පාලන ක්‍රමයක් හා නීතියක් ලෙසය
    4. පාලන ක්‍රමයක් හා ජීවන වෘත්තියක් ලෙසය (...................)

06. ශ්‍රී ලංකාවේ වැඩිම දිස්ත්‍රික්ක සංඛ්‍යාවක් ඇති පළාත වන්නේ,
    1. උතුර පළාත යි 2. දකුණු පළාත යි
    3. වයඹ පළාත යි 4. නැගෙනහිර පළාත යි (...................)

07. පහත සඳහන් වන්නේ මිනිසා අයිතිවාසිකම් දිනා ගැනීමට කරන ලද ඓතිහාසික විප්ලව කීපයකි. "අ" තීරුවේ ඇති වර්ෂ "ආ" තීරුවට අනුපිළිවෙලට ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| | "අ" | | "ආ" |
|---|---|---|---|
| 1. | 1917 | A. | ඉංග්‍රීසි විප්ලවය |
| 2. | 1688 | B. | ඇමරිකන් විප්ලවය |
| 3. | 1776 | C. | ප්‍රංශ විප්ලවය |
| 4. | 1789 | D. | රුසියන් විප්ලවය |

1. ABCD 2. BCDA 3. CDAB 4. DABC

(....................)

08. රටක සිදුවන ප්‍රධාන ආර්ථික කටයුතු ඇතුළත් වන වඩා නිවැරදි කාණ්ඩය තෝරන්න.

1. නිෂ්පාදනය, හුවමාරුව, පරිභෝජනය 2. නිෂ්පාදනය, ඉතිරි කිරීම, හුවමාරුව
3. ඉතිරි කිරීම, වෙළඳාම, නිෂ්පාදනය 4. ආයෝජනය, වෙළෙඳාම, පරිභෝජණය

(....................)

09. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන උපක්‍රමයක් වන්නේ මින් කුමක්ද ?

1. ප්‍රාරම්භනය 2. ජනමත විචාරණය
3. පුනරාවර්තනය 4. මේ සියල්ලම

(....................)

10. වෙළඳපොල ආර්ථික ලක්ෂණයක් වනනේ කුමක්ද ?

1. සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථික සැලසුම් සකස් කිරීම
2. දේපල අයිතිය රජය සතු වීම
3. නවෝත්පාදන සිදු නොවීම
4. දේශීය විදේශීය ආයෝජනය දිරි ගැන්වීම

(....................)

**පහත සඳහන් ප්‍රකාශ හරිනම් (√) ලකුණ ද, වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

11. මානව හිමිකම් කොමිසමේ සාමාජිකයන්ගේ ධුර කාලය අවුරුදු එකයි. (....................)
12. කාන්තාවන්ට එරෙහි සියළුම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය සීඩෝ (CEDAW) සම්මුතියයි. (....................)
13. එක්සත් ජාතීන් විසින් සම්මතකරනලද සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියේ වගන්ති 75 ක් ඇත. (....................)
14. ග්‍රීක පෞර රාජ්‍ය තුළ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක විය. (....................)
15. රටක උත්තරීතර නීතිය මෙන්ම මූලික නීතිය වන්නේද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. (....................)
16. වගකීම් ඉටුකිරීම සම්බන්ධයෙන් බැඳීම, වගවීම නම් වේ. (....................)
17. ශ්‍රී ලංකාවේ නීතිපතිවරයා පත්වන්නේ සර්ව ජන ඡන්ද බලයෙන්ය. (....................)

18. සංස්කෘතිය යනු දැනුම, ඇදහිලි, කලා, නීති, සිරිත් විරිත්, ඇගයීම් හා මිනිසුන්ගේ පුරුදු ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තයයි. (....................)

19. ශ්‍රී ලංකාවේ ග්‍රාම නිලධාරී තනතුර ලන්දේසි සමයේ පැවති ඇඩිවකේට් ෆිස්කෝල් තනතුරෙන් ආරම්භ විය. (....................)

20. රාජ්‍ය සේවා කොමිසම, පොලිස් කොමිසම හා මැතිවරණ කොමිසම පත් කරනු ලබන්නේ ජනාධිපති විසිනි. (....................)

**අංක 21 සිට 30 දක්වා එක් එක් වගන්තිය අවසානයේ දැක්වෙන වරහන තුළින් ගැලපෙන වචනය තෝරා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

21. එක් සංස්කෘතියක අංග ලක්ෂණ තවත් සංස්කෘතියක් තුළ ව්‍යාප්ත වීම................................ ලෙස හැඳින්වේ. ( විසරණය, වාණිජකරණය, ගෝලීයකරණය)

22. පෞද්ගලික දේපල අයිතිය හා ලාභ චේතනාව.............................................. ආර්ථික ක්‍රමයේ ලක්ෂණයකි. ( ධනවාදී, සමාජවාදී, මිශ්‍ර )

23. ප්‍රථමයෙන් බිහි වූ ජාතික රාජ්‍ය වන්නේ, ........................................................ ය. (ජර්මනිය හා ඉතාලිය, ස්පාඤ්ඤය හා පෘතුගාලය, බ්‍රිතාන්‍ය හා ප්‍රංශය)

24. තේසවලාමෙයි නීතිය ........................................................ අදාල වේ. (මුළු දිවයිනටම, පහතරට ජන කොටස් සඳහා, යාපනයේ ජීවත් වන ජන කොටස් සඳහා)

25. ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව වයස අවු.............................. ට අඩු සෑම පුද්ගලයෙකුම ළමයා යන්නෙන් අදහස් කෙරේ. (16, 18, 21 )

26. වර්තමාන ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීන් තෝරා ගන්නේ ........................................ නියෝජන ක්‍රමය අනුවය. ( ජනවාර්ගික, සමානුපාතික, ආගමික)

27. "එක්කෝ මානව සංහතිය යුද්ධය අවසන් කළ යුතුය. නැතිනම් මානව සංහිතිය යුද්ධය අවසන් කරයි." යනුවෙන් හිටපු ඇමරිකානු ජනාධිපතිවරයෙකු වූ ........................................ ප්‍රකාශ කළේය. (රොනල්ඩ් රේගන්, ජෝන්එෆ් කෙනඩි, වුඩ්රෝ විල්සන්)

28. සිවිල් හෝ අපරාධ නඩු වලදී රජයේ පාර්ශවය නියෝජනය කරන්නේ ........................ ය. ( පොලිස්පති, හමුදාපති, නීතිපති)

29. ශ්‍රී ලංකාවේ පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා යන නිලනාමයෙන් හඳුන්වනු ලබන්නේ ........................................................ය. (වේත්‍රධාරී, සභානායක, ඔම්බඩ්ස්මන්)

30. ආණ්ඩුව ගන්නා තීරණවලට කැමැත්ත හෝ අකැමැත්ත ප්‍රකාශ කිරීමට මහජනතාවට ඇති අවස්ථාව ........................................................ නම් වේ. (සර්වජන ඡන්ද බලය, ජනමත විචාරණය, මහ මැතිවරණය)

**අංක 31 සිට 40 තෙක් ප්‍රශ්න වලට <u>නොගැලපෙන</u> ප්‍රකාශය තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

31. ජනාධිපති ආණ්ඩුක්‍රමයක,
   1. ව්‍යවස්ථාදායකය තුළින් විධායකය බිහිවේ.
   2. විධායක බලය ජනාධිපති විසින් හසුරුවයි.
   3. ව්‍යවස්ථාදායකය හා විධායකය ස්වාධීනව තේරීපත් වේ.
   4. ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සබඳතාවය දුරස්ථ. (....................)

32. ශ්‍රී ලංකාවේ වර්තමාන පළාත් පාලන ආයතනය ලෙස සැලකෙන්නේ,
1. නගර සභාය
2. සුළු නගර සභාය
3. මහ නගර සභාය
4. ප්‍රාදේශීය සභාය (……………….)

33. සිවිල් නීතිය අනුව දඬුවම් ලැබිය හැකි වරදකි.
1. සොරකම
2. ස්ත්‍රී දූෂණය
3. විවාහ ගිවිසුම් කඩ කිරීම
4. මිනී මැරීම (……………….)

34. සදාචාරාත්මක වශයෙන් ඉටුකළ යුතු යුතුකමක් වන්නේ,
1. සිරිත් විරිත් සම්ප්‍රදායන්ට ගරු කිරීම.
2. පරිසරය සුරැකීම.
3. පොදු දේපල ආරක්ෂා කිරීම.
4. දෙමාපියන්ට, වැඩිහිටියන්ට සැලකීම. (……………….)

35. ධනවාදී අර්ථ ක්‍රමයක් තුළ,
1. ලාභ ඉපැයීමට ප්‍රමුඛ තැනක් ලැබේ
2. ආර්ථික කටයුතු පෞද්ගලික අයිතිය යටතේ පැවතී
3. ප්‍රචාරණ උපක්‍රම මගින් පාරිභෝගිකයන් තම නිෂ්පාදන වෙත ආකාර්ශනයකර ගැනීමට පෞද්ගලික නිෂ්පාදනයන් සමත් වේ
4. නිෂ්පාදන සම්පත්වල අයිතිය රජය සතුය (……………….)

36. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ අරමුණක් නොවන්නේ,
1. නීති මගින් මානව හිමිකම් ආරක්ෂා කර දීම
2. රටවල් අතර ආගමන හා විගමන පාලනය කිරීම
3. ජාතීන් අතර මිත්‍ර සබඳතා වර්ධනය කිරීම
4. ජනතාවට වඩා යහපත් ජීවන තත්වයක් උදා කරදීම (……………….)

37. ක්‍රි.ව. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාල ලක්ෂණ ය,
1. ජාතික රාජ්‍ය සභාව ය
2. සරල බහුතර නියෝජනය ය
3. නාමික විධායකය ය
4. සමානුපාතික නියෝජන ක්‍රමයය(……………….)

38. නීතිය,
1. සංවිධානය වූ සමාජයක පුද්ගලයන්ගේ බාහිර හැසිරීම්
2. අධිකාරී බලය පදනම් කරගෙන රාජ්‍ය විසින් පනවයි
3. මහජනයා විසින් මහජනයා උදෙසා පවත්වා ගන්නා මහජන පාලනය
4. පොදු සමාජ යහපත අරමුණු කරගෙන පැනවී ඇත (……………….)

39. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය නොපැවති අවස්ථාවකි,
1. ඉන්දියාවේ ලිච්ඡවි රජ දරුවන්ගේ පාලන ක්‍රමය
2. හිට්ලර් ජර්මනිය පාලනය කළ ක්‍රමය
3. ශ්‍රී ලංකාවේ පණ්ඩුකාභය රජ සමයේ ගම් පාලනය සඳහා පැවති ගම්සභා ක්‍රමය
4. ග්‍රීසියේ පෞර හෙවත් නගර රාජ්‍යයන්හි පාලන ක්‍රමය (……………….)

40. ගැටුම් නිරාකරණයට මැදිහත් කරුවෙකු වීමේදී, මින් නොගැළපෙන පිළිතුර වන්නේ,
1. ඉවසිලිමත්ව ඇහුම්කන් දෙන්නෙකු විය යුතුය
2. මධ්‍යස්ථ හා අපක්ෂපාති අයෙකු විය යුතුය
3. ආගමික ස්ථානයක හැදී වැඩුනු අයෙකු විය යුතුය
4. අවංක චේතනාවෙන් සමථ කරණයට මැදිහත් වූ අයෙකු විය යුතුය (……………….)

(ල 1 x 40 = 40)

# දෙවන වාර පරීක්ෂණය - 2014
## පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජාපාලනය - II කොටස

**11 ශ්‍රේණිය**

කාලය - පැය 02

---

**පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
**පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01.
1. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම සම්බන්ධයෙන් මෑතදී ගනු ලැබූ ප්‍රධාන ප්‍රයත්නයක් දෙකක් සඳහන් කරන්න.
2. ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීමේදී සලකා බලන සාධක 02ක් ලියන්න.
3. යහ පාලනය යනු හොඳ පාලනයකි. යහපාලනයක තිබිය යුතු ගුණාංග 02 ක් දක්වන්න.
4. ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු 02 ක් ලියන්න.
5. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන කොටස් 4ට අමතරව ජීවත්වන සුළු ජන කොටස් 02 ක් නම් කරන්න.
6. ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම 02 ක් නම් කරන්න.
7. ජනාධිපති ආන්ඩුක්‍රමයක මූලික ලක්ෂණ 2 ක් ලියන්න.
8. ශ්‍රී ලංකාවේ මහාධිකරණය සතු බලතල 02 ක් ලියන්න.
9. දේශපාලන අයිතිවාසිකම් 02 ක් ලියන්න.
10. ඌව පළාතට අයත් දිස්ත්‍රික්ක දෙක නම් කරන්න. (2 x 10 = 20 )

02.
1. ජාතික රාජ්‍ය යන්න නිර්වචනය කරන්න. (ල. 2)
2. ජාතික රාජ්‍ය නිර්මාණයට බලපෑ හේතු 03 ක් දක්වන්න. (ල. 3)
3. ආණ්ඩුවක ප්‍රධාන ආයතන 03 ක් නම් කර නීති ක්‍රියාත්මක කිරීම කරනු ලබන ආයතනයෙන් ඉටුවන කාර්යයන් 02 ක් පැහැදිලි කරන්න. (ල. 5)

03.
1. ධනවාදී අර්ථ ක්‍රමයක හා සමාජවාදී අර්ථක්‍රමයක වෙනස්කම් 02 ක් ලියන්න. (ල. 2)
2. ඕනෑම අර්ථිකයක් පොදුවේ මුහුණ දෙන මූලික ආර්ථික ප්‍රශ්න 03 ක් නම් කරන්න. (ල. 3)
3. අතීතයේ සිට වර්තමානය තෙක් සමාජය සංකීර්ණ වෙමින් විවිධ යුග පසුකර ඇත. එවැනි සමාජ යුග 03 ක් නම් කර ඉන් එක් යුගයක සුවිශේෂී ලක්ෂණ 02 ක් නම් කරන්න. (ල. 5)

04.
1. බහු සංස්කෘතික සමාජයක් යන්න නිර්වචනය කරන්න. (ල. 2)
2. බහු සංස්කෘතික සමාජයක් ඇති වීම කෙරෙහි බලපාන සාධක 03 ක් ලියන්න. (ල. 3)
3. බහු සංස්කෘතික සමාජයක වැදගත්කම ශ්‍රී ලංකාව ඇසුරෙන් විස්තර කරන්න. (ල. 5)

05.
1. සීඩෝ සම්මුතියට අනුව කාන්තාවන්ට හිමි අයිතිවාසිකම් 02 ක් සඳහන් කරන්න.(ල. 2)
2. ළමා අයිතිවාසිකම් සම්මුතියට අනුව ළමයා යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?(ල. 3)
3. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මගින් සහතික කර ඇති අයිතිවාසිකම් රාශියකි. ඒවායෙන් 02 ක් සඳහන් කෙටියෙන් විස්තර කරන්න. (ල. 5)

06. 1. නීතියේ ආධිපත්‍ය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ? (ල. 2)

2. "කෙනෙකුට සැරයටිය වනමින් පාරේ ගමන්කළ හැකි වුවත් එම නිදහස අනෙකාගේ නාසය අගින් කෙලවර වේ." යනුවෙන් හැරල්ඩ් ජේ. ලැස්කි නම් දාර්ශනිකයා ප්‍රකාශකර ඇත. මේ මගින් පැහැදිලි වන්නේ කුමක්ද ? (ල. 3)

3. මානව හිමිකම් කඩවීමට බලපාන කරුණු 02 ක් සඳහන් කර මානව අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම් අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

07. 1. රාජ්‍ය නීති නිලධාරීන් දෙදෙනෙක් නම් කරන්න. (ල. 2)

2. අධිකරණයේ කාර්යයන් 03 ක් ලියා දක්වන්න. (ල. 3)

3. පළාත් බද මහාධිකරණයේ කාර්යයන් 02 ක් ලියා පැහැදිලි කරන්න. (ල. 5)

The National e-learning Portal for The General Education